# ඇබෑර්තු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මඟින් ස්ථාපිත කරන ලද කාර්යාලකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා වසර 2ක **කොන්ත්‍රාත් පදනම** මත (මාස 3 ක පරිවාස කාලයක් ඇතුලත්ව) සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## රැකවරණ ප්‍රධානී (තනතුරු 01) HM 1-1
## Head of Protection

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රාදේශීය කාර්යාලවල රැකවරණ ඒකකය පවත්වාගෙන යාම අධීක්ෂණය හා සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආශ්‍රිතව විධිමත් රැකවරණ ක්‍රමවේදයන් සහ අනුගමනය කළයුතු පිළිවෙත් ඇතුලත්ව, වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීම පිළිබඳ වගකීම දැරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය/ සාමය සහ ගැටුම් නිරාකරණය/ දේශපාලන විද්‍යාව/ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රවල ප්‍රථම උපාධියක් **සමඟ** අදාල ක්ෂේත්‍රයේ/ මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් **සමඟ** රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමණාකරන මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

**වයස :** අවු. 35 ට නොඅඩු විය යුතු අතර අවු. 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප :** රු. 80,295 /=

මෙම තනතුරට වාහන දීමනාවක්,ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

## වින්දිත හා පවුල් සහය ප්‍රධානී (තනතුරු 01) HM 1-1
## Head of Victim and Family Support

**රැකියාවේ ස්වභාවය :** වින්දිත සහ පවුල් සහය ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ අදාල උපායමාර්ගික චාරිත්‍ර විධි සකස්කිරීම හා විශේෂඥයන් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් සකස්කොට වැඩි දියුණු කිරීමද ඇතුලත්ව OMP ආයතනයෙහි මනෝසමාජයීය සහය සහ ප්‍රජා සේවා ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ගික සැලසුම් හා සමාලෝචන කටයුතු වල නායකත්වය දැරීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව / උපදේශනය හා මනෝවිද්‍යාව / දර්ශනය හා මනෝවිද්‍යාව/ සමාජ

විද්‍යාව / සාමය හා ගැටුම් නිරාකරණය යන ක්ෂේත්‍රයක මූලික උපාධියක් **සහ** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් **සමඟ** රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 80,295 /=

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා ද හිමිවේ.

## නීති, ප්‍රතිපත්ති හා පර්යේෂණ ප්‍රධානී (තනතුරු 01) HM 1-1
## Head of Legal Policy and Research

**රැකියාවේ ස්වභාවය :** නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකයේ යුතුකම් සහ වගකීම් ඉටු කිරීම සහ අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම් සඳහා නීතිමය බැඳීම් හැසිරවීමට සහය වීම, නීතිමය අභියෝගවලට මුහුණ දීම සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීතිමය, ප්‍රතිපත්ති සහ පර්යේෂණ මැදිහත්වීම සඳහා උපදේශනය සඳහා උපාය මාර්ග සැකසීම හා සමාලෝචන කටයුතු වල නායකත්වය දැරීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ මූලික උපාධියක් සහ දිවුරුම් දුන් නීතිඥවරයෙකු වීම **සහ** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් **සමඟ** රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය

**වැටුප** : රු. 80,295 /=

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා ද හිමිවේ

## සන්නිවේදන හා ක්ෂේත්‍ර ප්‍රධානී (තනතුරු 01) HM 1-1
## Head of Communication & Outreach

**රැකියාවේ ස්වභාවය :** සන්නිවේදන සහ ක්ෂේත්‍ර ඒකකයේ යුතුකම් සහ වගකීම් ඉටු කිරීම සහ මුද්‍රිත, විද්‍යුත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඇතුළු බහුවිධ වේදිකා හරහා සන්නිවේදන උපාය මාර්ග සකස් කිරීම, සමාලෝචන සහ සංවර්ධනය කිරීම ඇතුළත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ව්‍යාපෘති ප්‍රවේශය සහ සන්නිවේදනය සම්බන්ධ කටයුතුවල නායකත්වය දැරීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය/ ජන මාධ්‍ය යන ක්ෂේත්‍රයක මූලික උපාධියක් **සහ** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් **සමඟ** රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 80,295 /=

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා ද හිමිවේ.

## ජ්‍යෙෂ්ඨ රැකවරණ නිලධාරී (තනතුරු 01) MM 1-1
## Senior Protection Officer

**රැකියාවේ ස්වභාවය :** වින්දිතයන්, සාක්ෂිකරුවන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාල ආරක්ෂා කිරීමේ ක්‍රම සහ ක්‍රියා පිළිවෙත් සැලසුම් කිරීම ඇතුළු ඒකකයේ වැඩ කටයුතු ඉටු කිරීම සඳහා ඒකක ප්‍රධානියාට සහය වීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මානව අයිතිවාසිකම්/ නීතිය/ සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ උපදේශනය පිළිබඳ උපාධියක් **සහ** ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 53,175 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂක (තනතුරු 01) MM 1-1
## Senior Data Analyst

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි දත්ත කළමනාකරණ ඒකකයෙහි සංඛ්‍යාලේඛන පවත්වාගෙනයාම සහ එම අංශයෙහි කාර්යක්ෂමතාවය නගා සිටුවන්නට අදාල දත්ත රැස් කිරීමේ ක්‍රම, දත්ත විශ්ලේෂණය හා අනෙකුත් උපායමාර්ග සංවර්ධනය කර පවත්වාගෙන යාම.

**සුදුසුකම්** : **1.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ ගණිතය/ සංඛ්‍යානය පිළිබඳ උපාධියක් **සහ** ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද

**හෝ**

**2.** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 7) වැනි මට්ටමට නොඅඩු තොරතුරු තාක්ෂණයට අදාල ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සමඟ** ඉන් අනතුරුව අදාළ ක්ෂේත්‍රයෙහි රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් අවුරුද්දක පලපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.53,175 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## ප්‍රාදේශීය සම්බන්ධීකාරක (ප්‍රධාන) (තනතුරු 01) MM 1-1
## Regional Coordinator

**රැකියා ස්වභාවය** : අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාලයේ බාධා රහිත හා ඵලදායි ක්‍රියාකාරිත්වය ඇතුළුව රාජකාරි සහ වගකීම්වලට සහභාගී වීම සහ ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මානව හිමිකම්/ නීතිය/ මානව සම්පත් කළමනාකරණ / කළමනාකරණ/ පරිපාලන/ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක් **සමඟ** තනතුරට අදාල ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.53,175 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## ප්‍රාදේශීය සම්බන්ධීකාරක (උප) (තනතුරු 03) MM 1-1
## Regional Coordinator

**රැකියා ස්වභාවය** : අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ උප කාර්යාලයේ බාධා රහිත හා ඵලදායි ක්‍රියාකාරිත්වය ඇතුළුව රාජකාරි සහ වගකීම්වලට සහභාගී වීම සහ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාල සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මානව හිමිකම්/ නීතිය/ මානව සම්පත් කළමනාකරණ / කළමනාකරණ/ පරිපාලන/ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක් **සමඟ** තනතුරට අදාල ක්ෂේත්‍රයක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.53,175 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## පරිපාලන නිලධාරී (තනතුරු 01) JM 1-1
## Administrative Officer

**රැකියාවේ ස්වභාවය** : අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලුම පරිපාලන කටයුතු නියෝජ්‍ය පරිපාලක සහ සහකාර පරිපාලක ප්‍රධානියා සමඟ සම්බන්ධීකරණය කිරීම සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අංශ සමඟ පරිපාලන ගැටළු සම්බන්ධයෙන් සන්නිවේදනය සඳහා වගකීම ඇතුළත් රාජකාරි හා වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිපාලන/ කළමනාකරණ/ මානව සම්පත් කළමනාකරණ / රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයක උපාධියක්.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.42,600 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## තොරතුරු තාක්ෂණ නිලධාරී (තනතුරු 01) JM 1-1
## IT Officer

**රැකියාවේ ස්වභාවය** : කාර්යාලයේ පරිගණක දෘඩාංග, මෘදුකාංග, පද්ධති, ජාල, මුද්‍රණ යන්ත්‍ර සහ ස්කෑනර් අධීක්ෂණය සහ නඩත්තු කිරීම මෙන්ම සේවා ගැටළු සහ ඉල්ලීම් සඳහා කාලෝචිත ලෙස ප්‍රතිචාර දැක්වීම සහ තාක්ෂණික සහාය ලබා දීම ඇතුළත් රාජකාරි හා වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම්** : **1.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව කේෂ්ත්‍රයක උපාධියක්.

**2.** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

**3.** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද

**4.** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර පහක (10) පළපුරුද්ද.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.42,600 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## පර්යේෂණ නිලධාරී (තනතුරු 02) JM 1-1
## Research Officer

**රැකියාවේ ස්වභාවය** : අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ පර්යේෂණ ඒකකයෙහි අදාල කාර්යයන් සඳහා සහය වීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව ක්ෂේත්‍රයක උපාධියක්

**වයස** : අවු. 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : රු. 42,600 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## වින්දිත හා පවුල් සහාය නිලධාරී (තනතුරු 03) JM 1-1
## Victim and Family Support Officer

**රැකියාවේ ස්වභාවය** : ස්ත්‍රී/ පුරුෂභාවයට සංවේදී වූ පරිසරයක් ශක්තිමත් කිරීම හා පවත්වා ගැනීම ද ඇතුළත්ව, අතුරුදහන් වූ හා සොයා ගැනීමට නොහැකි තැනැත්තන්ගේ පවුල් වෙනුවෙන් OMP කාර්යාලය විසින් ලබා දෙනු ලබන සියලුම සහාය හා සේවා ආශ්‍රිතව වින්දිතයන් කේන්ද්‍ර කොටගත් ප්‍රවේශයන් සහතික කරනු පිණිස වන වින්දිත හා පවුල් සහාය ඒකකයේ කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මානව හිමිකම්/ මනෝ විද්‍යාව/ උපදේශනය හා මනෝ විද්‍යාව/ සමාජ විද්‍යාව ක්ෂේත්‍රයක උපාධියක්.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.42,600 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## සන්නිවේදන නිලධාරී (තනතුරු 02) JM 1-1
## Communication Officer

**රැකියාවේ ස්වභාවය** : අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අන්තර්ගතය, මාධ්‍ය නියැලීම සහ සමාජ මාධ්‍ය ඇතුළත් ඵලදායී සන්නිවේදන උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන යුතුකම් සහ වගකීම්වලට සහභාගී වීම සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉදිරි කටයුතු සඳහා උපකාර වන මාධ්‍යවේදීන්, බ්ලොග්කරුවන්, ආයෝජකයින් සහ පාරිභෝගික සමඟ සබඳතා ගොඩනඟා ගැනීම සහ පවත්වාගෙන යාම ඇතුළත් රාජකාරි හා වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ජන මාධ්‍ය/ ජන සන්නිවේදනය ක්ෂේත්‍රයක උපාධියක්.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු.42,600 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## භාෂා පරිවර්තක (තනතුරු 02) MA 1-1
## Translator

**රැකියාවේ ස්වභාවය** : එක් භාෂාවකින් කියවීමේ හෝ සවන් දීම, එහි අර්ථය සහ සන්දර්භය පිළිබඳ අවබෝධය තහවුරු කර ගැනීම සහ එය දෙවන භාෂාවක් බවට පරිවර්තනය කිරීම, මුල් අර්ථය ආරක්ෂා කිරීමට වගබලා ගැනීම ඇතුළත් රාජකාරි හා වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිවර්තන අධ්‍යයනය/ භාෂා (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) උපාධියක්.

**වයස** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 37,970 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## සභාපති/විධායක අධ්‍යක්ෂ පුද්ගලික සහායක (තනතුරු 01) MA 1-1
## Personal Assistant to Chairperson/ Executive Director

**රැකියාවේ ස්වභාවය** : සියලුම ලේකම්කරණ කාර්යයන් ඉටුකරමින් සභාපති / විධායක අධ්‍යක්ෂ වෙත අවශ්‍ය කාර්යාලීය සහය ලබාදීම.

**සුදුසුකම්** : (අ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ

(I) සිංහල / දෙමළ (II) ඉංග්‍රීසි භාෂාව (III) ගණිතය යන විෂයයන් 4 සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6කින් එක් වරකදි සමත් වීම.

**සහ**

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ ) විභාගයේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) අනෙකුත් විෂයන් 03 සමත් වීම.

මානව සම්පත් කළමනාකරණ/ ලේකම් පරිචය /පරිපාලන අධ්‍යයනය ක්ෂේත්‍රයක ඩිප්ලෝමාවක් සතු වීම, අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 27,910 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

## දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරු (තනතුරු 03) MA 1-1
## Data Entry Operator

**රැකියාවේ ස්වභාවය** : අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත කළමනාකරණ ඒකකයේ අදාළ යුතුකම් සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම්** : (අ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ

(I) සිංහල / දෙමළ (II) ඉංග්‍රීසි භාෂාව (III) ගණිතය යන විෂයයන් 4 සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6කින් එක් වරකදි සමත් වීම.

**සහ**

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ ) විභාගයේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) අනෙකුත් විෂයන් 03 සමත් වීම.

(ඇ) පරිගණක පුහුණුව හෝ දත්ත ඇතුළත් කිරීම පිළිබඳ සහතිකයක් තිබීම අමතර සුදුසුකමක් වේ.

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය

**වැටුප** : රු. 27,910 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ

**කළමනාකරණ සහකාර (තනතුරු 12)** **MA 1-1**
**Management Assistant**

**රැකියාවේ ස්වභාවය** : බලයලත් නිලධාරියාගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ කාර්යයන්/ක්‍රියාකාරකම්වල රාජකාරි සහ වගකීම්වලට ඉටු කිරීම සහ සංවිධානයේ කළමණාකාර, පරිපාලන සහ විධායක ශ්‍රේණිවල රාජකාරි ඉටුකිරීමට පහසුකම් සැලසීම/සහාය වීම.

**සුදුසුකම්** : (අ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ

(I) සිංහල / දෙමළ (II) ඉංග්‍රීසි භාෂාව (III) ගණිතය යන විෂයයන් 4 සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6කින් එක් වරකදී සමත් වීම.

**සහ**

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ ) විභාගයේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) අනෙකුත් විෂයන් 03 සමත් වීම.

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 27,910 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

**කාර්යාල කාර්යය සහයක (තනතුරු 04)** **PL -1**
**KKS (Office Aide)**

**රැකියාවේ ස්වභාවය** : අදාළ ඒකකයේ රාජකාරි සහ වගකීම්වලට සහාය වීම, ඒකක ප්‍රධානියා විසින් පවරා ඇති පරිදි සහ බලයලත් නිලධාරියාගේ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ කාර්යයන්/ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සංවිධානයේ කළමණාකාර, පරිපාලන සහ විධායක ශ්‍රේණිවල රාජකාරි ඉටු කිරීමට පහසුකම් සැලසීම/ සහාය වීම ඇතුළත් රාජකාරි හා වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම්** : අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් උපරිම වාර 2 ක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථ 2ක් සමඟ විෂයන් 6 ක් සමත් වීම

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 24,750 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

**රියැදුරු (තනතුරු 02)** **PL -1**
**Driver**

**රැකියාවේ ස්වභාවය** : සංවිධානයේ පරිපාලන හා විධායක ශ්‍රේණිවල අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ වාහනය නඩත්තු කිරීම, ධාවන ප්‍රස්ථාරය යාවත්කාලීන කිරීමට අදාළ කාර්යයන් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

**සුදුසුකම්** : අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් උපරිම වාර 2 ක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථ 2ක් සමඟ විෂයන් 6 ක් සමත් වීම **සහ** බර වාහන පැදවීම සඳහා මෝටර් රථ

ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබාගෙන තිබීම **සහ** රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීමේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද.

**වයස** **:** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** **:** රු. 26,290 /= + අනුමත අනෙකුත් දීමනා හිමිවේ.

**ඉහත සියලුම තනතුරු සඳහා අදාළ වන කරුණු :**

- සෑම අයදුම්කරුවෙක්ම,
  - ✓ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
  - ✓ යහපත් කායික හා මානසික තත්වයෙන් යුක්ත විය යුතුය
  - ✓ දිවයිනෙහි ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකිවිය යුතුය
  - ✓ යහපත් චරිතයකින් හෙබි විය යුතුය
- මෙම සියලුම තනතුරු වසර 2ක **කොන්ත්‍රාත්** කාලයක් සඳහා බඳවා ගනු ලැබේ (මාස 3 ක පරිවාස කාලයක් ඇතුලත්ව). මූලික වැටුපට අමතරව අනුමත අනෙකුත් දීමනා හිමිවේ.
- පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.
- අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.
- අප විසින් සපයා ඇති අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු වූවකු නම් අදාල ආයතන හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් බහා එවන කවරයේ **වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර** සඳහන් කළ යුතුය. එසේ තනතුර සඳහන් නොකරන අයදුම්පත් **ප්‍රතික්ෂේප** කරනු ලැබේ.
- අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
- අයදුම්කරුවන් විසින් එවනු ලබන අයදුම්පත් අතරින් තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී ලබාගන්නා ඉහළ ලකුණු මත තෝරා ගනු ලැබේ.
- අයදුම්පත්, අදාල සහතිකවල පිටපත් සමඟ **2024 නොවැම්බර් 05** වන දිනට පෙර **විධායක අධ්‍යක්ෂ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03** වන මහල, **බුත්ගමුව පාර, රාජගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**නීතිඥ මහේෂ් කටුලන්ද**
**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**